**දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව ව්‍යාපෘතිය I කොටස - 2017**

**-----------------------------------------------------------------------**

දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව ව්‍යාපෘතියේ - I කොටසේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා චීන අපනයන ආනයන බැංකුව අතර 2014 දෙසැම්බර් 23 දින එළඹි අංක. පීබීසී අංක. (2014) 27 එකතු අංක. 321 හා 2015 දෙසැම්බර් 11 දින එළඹි අංක. පීබීසී අංක. (2014) 27 එකතු අංක. 321 ඒ(1) දරන ණය ගිවිසුම් සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**1.2 <u>ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය</u>**

ව්‍යාපෘතියේ ණය ගිවිසුම් අනුව, මාර්ග හා මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර, මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වන්නේ, ජාත්‍යාන්තර ආයෝජන කේන්ද්‍රයක් ලෙස හම්බන්තොට සංවර්ධනය කිරීම සඳහා සහාය හා කාර්යයන් පහසුකරලීම සඳහා මාර්ග ජාලය සංවර්ධනය කිරීමයි. ව්‍යාපෘතියේ - I කොටස යටතේ මාතර සිට බෙලිඅත්ත දක්වා දක්ෂිණ අධිවේගී මාර්ගය කිලෝමීටර් 30 කින් දීර්ඝ කිරීමේ කොන්ත්‍රාත් වැඩවල ව්‍යාපෘති ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 103,280 ක් වූ අතර එයින් සිවිල් කොන්ත්‍රාත් වැඩ සහ උපදේශන සේවා සඳහා රු.මිලියන 87,788 කට සමාන එ.ජ.ඩො. මිලියන 683.49 ක් සැපයීමට චීන අපනයන ආනයන බැංකුව එකඟ වී තිබුණි. ව්‍යාපෘතියේ I කොටස යටතේ අධිවේගී මාර්ගයේ කොන්ත්‍රාත් වැඩ කටයුතු 2016 ජනවාරි 19 දින ආරම්භ කරන ලද අතර 2019 ජූලි 18 වන විට නිම කිරීමට නියමිතය.

**1.3 <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ වගකීම්</u>**

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.4 <u>විගණකගේ වගකීම</u>**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට අනුකූලව මගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැළසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් පිළිබඳ විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදනම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීමේදී, අවස්ථාවෝචිත උචිත විගණන පරිපාටි සැළසුම්කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම විගණනයට ඇතුලත්වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂාවට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කළ ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම් වලට අදාල පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරුවනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම් ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජය හා ණය සපයනු ලබන නියෝජිත ආයතනයෙන් ලද අරමුදල් වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතු වලින් උත්ගත වූ වත්කම් සහ වගකීම් හා ණයවලින් කරන ලද මිලදී ගැනීම් හඳුනාගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වාගෙනයනු ලැබුවේද යන බව.

(ඈ) ණය යටතේ ආපසු ගැනීම්, ණය ගිවිසුම් වල දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදාගන්නා ලද වර්ගීකරණය අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(උ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමණාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(එ) ණය ගිවිසුම් වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 2. <u>මූල්‍ය ප්‍රකාශන</u>

### 2.1 <u>මතය</u>

මගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2017 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව, සහ

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබූ බව,

## 3. <u>මූල්‍ය හා භෞතික කාර්යසාධනය</u>

### 3.1 <u>අරමුදල් උපයෝජනය</u>

සමාලෝචිත වර්ෂය සඳහා සහ 2017 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය සහ මූල්‍යායනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුමට අනුව මූල්‍යනය කිරීමට එකඟ වූ මුදල | | 2017 වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ වෙන්කිරීම | අරමුදල් උපයෝජනය 2017 වර්ෂය තුළ | අරමුදල් උපයෝජනය 2017 දෙසැම්බර් 31 දක්වා |
|---|---|---|---|---|---|
| | එ.ජ.ඩො. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| චීන අපනයන හා ආනයන බැංකුව | 683.49 | 87,788.00 | 22,865.00 | 22,864.51 | 46,665.71 |
| ශ්‍රී ලංකා රජය | 120.62 | 15,492.00 | 3,690.43 | 3,156.79 | 12,407.15 |
| ශ්‍රී ලංකා රජය (ඉඩම්) | | | 1,465.48 | 1,465.49 | 1,972.63 |
| **එකතුව** | **804.11** | **103,280.00** | **28,020.91** | **27,486.79** | **61,045.49** |

### 3.2 <u>භෞතික ප්‍රගතිය</u>

ව්‍යාපෘතියේ I-කොටස යටතේ මාතර සිට බෙලිඅත්ත දක්වා දක්ෂිණ අධිවේගී මාර්ගය කිලෝමීටර් 30 කින් දීර්ඝ කිරීමේ කොන්ත්‍රාත් කටයුතුවල 2017 දෙසැම්බර් 31 දිනට අත්කර ගැනීමට අවශ්‍ය සමස්ත භෞතික ප්‍රගතිය සියයට 47.72 ක් වූ අතර සියයට 57.67 ක ප්‍රගතියක් අත්කර ගෙන තිබුණි.

### 3.3 <u>කොන්ත්‍රාත් පරිපාලනය</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවේ අවශ්‍යතා සපුරාලීම සඳහා 2016 දී සකස් කරන ලද අධිවේගී මාර්ගයේ ව්‍යුහාත්මක වැඩවල මූලික නිර්මාණ 2017 දී සංශෝධනය කර තිබුණි. එබැවින්, අධිවේගී මාර්ගය යටින් ගමන් කිරීමට ඇති පාලම් (Underpass) 21 ක සැලසුම්, යටින් ගමන් කිරීමට ඇති පාලම් 28 ක සැලසුම් දක්වා ඉහළ නංවා තිබුණි. තවද, ඉදිකිරීමට සැලසුම් කළ පාලම් 17 ක් සහ බෝක්කු 84 ක්, පාලම් 06 ක් සහ බෝක්කු 69 ක් දක්වා අඩු කර තිබුණි.

(ආ) ව්‍යාපෘතිය මගින් පුනරුත්ථාපනය කිරීමට නියමිත දේශීය මාර්ග 70 කට අදාල කිලෝමීටර් 30 ක ඉදිකිරීම් කටයුතු සඳහා වූ ප්‍රමාණ පත්‍ර (BOQs) වෙන වෙනම සකස් කර නොතිබුණි. තවද, අධිවේගී මාර්ගයන් ඉදිකිරීමට වඩා ඉහළ ගාස්තු රේටයන් දේශීය මාර්ග පුනරුත්ථාපනය කිරීම සඳහා භාවිතාකර ඇති බව නිරීක්ෂණය විය.

(ඇ) ව්‍යාපෘති කොන්ත්‍රාත්කරු විසින් බාහිර පාර්ශවයකට අයත් ඉඩමක ඉදිකිරීම් සහ වෙනත් අපද්‍රව්‍ය අනිසි ලෙස බැහැර කර තිබුණු අතර කුණු කසළ බැහැර කිරීමෙන් සිදුවූ හානිය සම්බන්ධයෙන් එම ඉඩමේ හිමිකරු විසින් රු. මිලියන 8 ක මුදලක් අතිරේකව ඉල්ලා තිබුණි.

## 3.4 මූල්‍ය පාලනය පිළිබඳ ගැටළු

මුදල් රෙගුලාසි 756 අනුව සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේම ව්‍යාපෘතියේ ඉන්වෙන්ට්‍රි භාණ්ඩ පිළිබඳව භාණ්ඩ සමීක්ෂණයක් සිදු කළ යුතුය. කෙසේවෙතත්, අදාළ වත්කම්වල භෞතික පැවැත්ම සහ භාරකාරීත්වය සනාථ කිරීම සඳහා භාණ්ඩ සමීක්ෂණ සිදු කර නොතිබුණි.

## 3.5 මානව සම්පත් කළමනාකරණය

ව්‍යාපෘතියේ කටයුතු ආරම්භයේ සිටම ජ්‍යෙෂ්ඨ ශාස්ත්‍ර පද්ධති සැලසුම් සහ ස්ථාපන ඉංජිනේරු , ජ්‍යෙෂ්ඨ ශාස්ත්‍ර පහසුකම් සැලසුම් සහ ස්ථාපන ඉංජිනේරු සහ ව්‍යාපෘති ජ්‍යෙෂ්ඨ රථවාහන මාර්ග ආරක්ෂණ ඉංජිනේරු වැනි ප්‍රධාන තනතුරු පුරප්පාඩු වී තිබුණි.